# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

## 2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික II පරීක්ෂණය
## දෙවන වසර
## 2017/2018 Academic Year - Semester II Examination
## Second Year

## අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම - EDSC 22053

**උපදෙස්**

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

1. සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ජීන් පියාජේගේ සදාචාර සංවර්ධන අවධි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

II. '**සංරෝධය**' හා '**සහයෝගය**' හඳුන්වන්න. (ලකුණු 02)

III. '**සංරක්ෂණ ප්‍රයෝග**' හතරක් නම් කරන්න. (ලකුණු 02)

IV. අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ ඉදිරිපත්ව ඇති පිළිගත් නිර්වචනයක් ලියන්න. (ලකුණු 02)

V. තැත්වරද න්‍යාය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

VI. '**අපසාරී චින්තනය**' හා '**අභිසාරී චින්තනය**' කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

VII. '**විතුලිතතාව**' යනු කමක් ද? හඳුන්වන්න. (ලකුණු 02)

VIII. ඉගෙනීම පිළිබඳ පියාජේගේ අදහස දක්වන්න. (ලකුණු 02)

IX. '**සංයුක්ත**' හා '**වියුක්ත**' සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

X. මානව අවශ්‍යතා පිළිබඳ අදහස් ඉදිරිපත් කළ මනෝවිද්‍යාඥයන් දෙදෙනෙක් නම් කර ඔවුන් ඉදිරිපත් කළ අවශ්‍යතා සංඛ්‍යාත්මකව දක්වන්න. (ලකුණු 02)

2.

I. ජීව පරිසර විද්‍යාත්මක න්‍යාය අනුව ළමා සංවර්ධනයට බලපාන විවිධ පරිසර පද්ධති නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

II. ජීන් පියාජේගේ ප්‍රජානන සංවර්ධන අවධි සංකල්පය අනුව ළමා සංවර්ධනය සිදුවන ආකාරය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 12)

3.

I. නිර්මාපී බව යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා, '**5 E**' පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 08)

II. ''මානව බුද්ධිය නිපුණතා සමූහයකින් සමන්විත ය. එම නිපුණතා සංවර්ධනයට මග පෙන්වීම ගුරුවරයාගේ කාර්යය වේ'' සාකච්ඡා කරන්න. (ලකුණු 12)

4.

I. සංජානනය සඳහා බලපාන විවිධ සාධක නිදසුන් මගින් හඳුන්වන්න.

(ලකුණු 08)

II. ඉගෙනුම් මාරුව යනු කුමක්දැයි පැහැදිලි කර, ඒ පිළිබඳ ඉදිරිපත්ව ඇති විවිධ මත හා න්‍යායන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

5.

I. පෞරුෂය පිළිබඳ පිළිගත් නිර්වචනයක් දක්වා, කාල් යුංග්ගේ පෞරුෂ න්‍යාය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

II. ළමයාගේ පෞරුෂ සංවර්ධනයට බලපාන විවිධ සාධක නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

6. පහත සඳහන් මාතෘකා **<u>හතරකට</u>** කෙටි සටහන් ලියන්න.

I. සංවේදනය හා අවධානය

II. සංකල්ප සාධනය

III. මතකය හා අමතක වීම

IV. පූර්ව ප්‍රසව අවධිය

V. නව යොවුන් වියේ ගැටලු

(ලකුණු 5×4 = 20)